# ගොවිතැන හා බැඳුනු සිංහල ගැමි රසකථා

## 1. ගොන් ගැසීම හෙවත් කමතේ ගවයන් දැක්වීම

කපාගත් ගොයම් මිටිබැඳ කමතට ගේන්නේ හරක් දමා පාගා බැත ලබාගැනීම සඳහාය. මේ සඳහා ඉස්සර ගැමියෝ බොහෝවිට තෝරා ගන්නේ රාත්‍රී කලයයි. විශාල ගොයම් ප්‍රමාණයක් නම් මුළු රාත්‍රිය පුරාවටම ගොයම් පෑගීමේ කටයුතු සිදුකරන්න ගොවියන්ට සිදුවේ. ඒ සඳහා ඇතැම් විට ගවයන් කැරලි දෙකක් භාවිතා කිරීමට සිදුවනු ඇත. කොහි හැටිවුවත් ගොයම් මැඩීමට කමතට රැස්වන ගොවියෝ ගවයන් තොරාගනු ලබන්නේ ඒ සඳහා පුරුදුව ඇති ගවයන්ගේ සේවය යි. එහි දී වඩාත් පලපුරුදු ගවයා කැරැල්ලේ මුලටම බඳින අතර අනිකුත් කෝඩුකාර ගවයා අගටම බඳිනු ලබයි. ඉන් පසුව ක්‍රමානුකූලව අතුරන ලද ගොයම මත මෙම ගවයන් දක්කනු ලැබේ. මෙසේ ගවයන් කමතේ මැද ඇති විය ගහවටේ දැක්කීමේ කටයුත්ත ළමයෙකුට පැවැරුනත් ඇතැම්විට ඒ සඳහා කැමැත්තක් දක්වන වැඩිහිටියෝද නැත්තේ නොවේ. මේ කියන තැනැත්තා මේ කටයුත්ත සඳහාම එනම් ගොන් ගැසීම සඳහාම කැමැත්තක් දැක් වූ තරමක් මෝඩපහේ තැනැත්තෙකි.



මේ තැනැත්තාට පැවැරුණ කටයුත්ත හරියටම ඉස්ටකිරීම නිසා සෑම ගොවියෙත්ම එම කටයුත්ත නොපැකිලව ඔහුට පවරණු ලැබූහ. මෙහිදී හාස්‍යවන්නේ ඔහුටම උරම වූ කවියක් හඩනගා කීමය.

"…. බඩ මැද අං ඇති පුංචි මීමෝ උවෝ උවෝ " යන්නය. බඩ මහත අං ඇති පුංචි මීමෝ යන්න ඔහු වටහා ගෙන තිබුනේ එසේය.

## 2. රවි, චන්ද්‍ර, කුජ, බුධඃ ගුරුඃ

මෙය ලංකාවේ පිහිටි ඉතාමත් පිටිසර ගමක සිදුවීමකි. එකල මේ ගමේ වැසියෝ වැඩි ප්‍රමාණයක්ම ජීවත් වූයේ ගොවිතැනෙ නි. කලට වේලාවට වී ගොවිතැන් කිරීම කාගේත් සහයෝගයෙන් එකමුතුවෙන් සිදුවිය. මෙහි දී කැපී පෙනුන දෙයක් වූයේ ගමේ දැන උගත් වැඩිහිටි අයෙකුගෙන් උපදෙස් ගෙන කටයුතු කිරීමයි. මෙය ඉතාමත් වැදගත් තැනක් ගත්තේ ගොවිතැනේ ප්‍රධාන කටයුතු සුභ දිනයන් හිදී සුභ වේලාවකට ආරම්භ කිරීමයි. ඒ අනුව මුලින්ම කුඹුරේ වැඩ පටන් ගැනීම, වී වැපිරීම, නෙලීම , ගොයම් කැපීම සහ පෑගීම වෙනි කටයුතු සුභ වේලාවන් වලදී ආරම්භ කරන ලදි, මේ සඳහා නැකැත් බලීම සඳහා ගමක ඒ ගැන දන්නා ගොවියෙක් වූ අතර සෙස්සෝ ඔහුවෙත ගොස් නැකැත් කටයුතු කරගන්නා ලදි.




මේ කියන ගමේ ඒ සදහා සිටියේ පොඩිඅප්පුහාමි යන නමින් හදුන්වන තැනැත්තෙකි. නැගීමටදිනක් ගමේ ගොවිමහතෙක් ඔහු කරා ගියේ වී වැපිරීම සඳහා සුදුසු නැකත් දිනයක් ලබා ගැනීමටය. ඔහු එහි යන විටදී පොඩිඅප්පුහාමි සිටියේ විටක් හපමින් නිදහසේය. ඔහු වෙත ගිය ගොවිමහතා ඔහුගේ අවශ්‍යතාවය කියූපසු ලිත ද රැගෙන ඔහු අසලට පැමිණියේ නැකත් දිනය සකසා දීමටය. පොඩිඅප්පුහාමි " **රවි, චන්ද්‍ර, කුජ, බුධඃ ගුරු** " යනුවෙන් හඩනගා කියුවේ ඔහුගේ වියක්තකම පෙන්වීමටය. ඔහුගේ ඒ හඩනැගීමෙන් ඔහුගේ මුවතුල රුවාගෙන තිබූ බුලත් හපයෙන් කොටසක් අර ගොවිමහතාගේ මුහුනට විසිවීම නිසා නැකැත් ඇසීමට ගිය ගොවි මහතාගේ මුවින් පිටවූයේ "චී චී පොඩිඅප්පුහාමි " යන්නය. මෙය ඇසුණු ගෙදර අය කලබලයට පත්වී එනවිට මුහුණේ බුලත්හප තැවැරුන ගොවිමහතා මිදුලේ තිබූ දිය බඳුනෙන් මුහුණ සෝදමින් සිටියේය. පසුව කාරණාව දැනගත් ගෙදර අය සිනාසුනේ මුව අතින් වසාගෙනය.

### 3. දුරදිග ගිය විහිළුව

මෙය ශ්‍රී ලංකාවේ එක්තරා ගම්මානයක ගොවියන් දෙදෙනකු අතර එකතරා සිදුවීමකි. මේ ගොවිමහතුන් දෙදෙනා වයසින් වෙනස් වුවත් මොවුන් එකිනෙකාට විහිළු කරගැනීම විනෝදාංශයක් වූයේය. මෙය ගමේ සියළු දෙදෙනාම දන්නා කරුනක් වූ අතර ඔවුන් කරන විහිළු දෙස බලා අනිකුත් ගැමියෝද ආස්වදයක් ලැබුවෝය. කොතරම් විහිළු කළත් මේ දෙදෙනාගෙන් කිසිවෙක් කේන්ති නොගැනීම මොවුන්ගේ විශේෂ ලක්ෂණයක් විය.

මොවුන් දෙදෙනා මුණගැසුණු විට අන්වර්ථනාමයකින් අනිකාට ආමන්ත්‍රණය කිරීම , පිටුපස සරම උස්සා දිවීම, කරේ තබාගෙන එන උදැල්ල පිටුපසින් ඇද බිම දමා අනිකා දිවීම කරන ලද විහිළුවලින් සමහරකි.



දිනක් එකෙක් පිටුපසින් පැමිණ අනිකාගේ අමුඩයේ ලණුව කපාදැම්මේ සුපුරුදු විහිළුවටය. අමුඩය එකවිටම බිම වැටුන අතර ඔහුට කරකියා ගත හැකි දෙයක් නොවූවෙන් අමුඩ රෙදි කඩ අත්දෙකින් ඇඟට තදකරගෙන ගෙදර දිව්වේ විලි ලැජ්ජාවෙන්ය. මෙය දුටු බොහෝ දෙනෙක් හූ හඬ දීම මේ දෙදෙනාගේ විහිළු එදායින් පසු නතර කිරීමට තරම් සමත් වූයේය.

### 4. අන්වර්ථ නමක් පටබැඳීම

මෙය ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ පෙර පැවැති කෘෂිකාර්මික පුහුණු මධ්‍යස්ථානයකි. තරුණ පිරිමි ළමුන් එකවර 30 ක් හෝ 40 ක් බඳවා ගෙන ඔවුන්ට කෘෂිකාර්මික පුහුණුවක්

ලබාදීම මෙම ආයතයේ මූලික කටයුත්තක් විය. මෙය නේවාසික පුහුණුවක් වනවා මෙන්ම පුහුණු කාළය මාස තුනේ සිට වසර දක්වා විය හැකිය. එහිදී න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික පුහුණුවක් ද මේ සිසුන්ට ලබා දෙයි.


දැනට වසර කීපයකට පෙර මෙම ආයතනයට කණ්ඩායමක් බඳවා ගත්තේ අංගසම්පූර්ණ කෘෂිපුහුණුවක් ලබා දෙනු සදහාය. වී ගොවිතැන පිලිබඳ ප්‍රායෝගික පන්තියකදී සිසුන්ට නියම වූයේ හැකිනම් කුඹුරේ ගොයම් අතරින් නම සදහන් කරන ලද ඉතා කුඩා කෘමියෙකු සොයා දෙන ලෙසයි. මේ සතා ඇසට දර්ශනය කරගැනීම ඉතා අපහසු වුවත් කලබලකාරී හැසිරීමක් නැති අයෙකුට ඌ අල්ලා ගතහැකි බවත් පාඩමහාර කෘෂි උපදේශක මහතා වැඩිදුරටත් කියුවේය. එසේම ඌ අල්ලා ගැනීම සිසුන් අතර අභියෝගයක් ලෙස ප්‍රකාශ කළ අතර එය කළහැකි සිසුවා අගය කලයුතුබවද කීවේය.

දැන් සැමදෙනාගේම උනන්දුව මේ  කෘමියා සොයා ගැනීමය. කෙසේ හෝ විනාඩි කීපයකින් එක් සිසුවෙක් නැගී සිටියේ "සොයා ගත්තා සොයා ගත්තා" යනුවෙන් කෑගසමින්. මොහුගෙන් කෘමියා ලබාගත් උපදේශකවරයා ඌ සිසුන්ට පෙන්නා සොයා ගත් සිසුවා ඇගැයීමක් ද කලේය. මින් පසු අනිකුත් සිසුවෝ සියළු දෙනාම මොහුට එදා පටන් කෘමියා යන අන්වර්ථනාමයෙන් අමන්ත්‍රණය කළෝය.

## 5. "ආඳාවලෙන්" මතු වූ හරකාබාන

පිටිසර ගමක ගොවියන් අතර ඈත අතීතයේ පටන් පැවැත එන අත්භූත කථාවක් නිසා පවතින විශ්වාශයකට මැදි වූ ගොවියන් කොටසක් ගැන ගොඩනැතුන කථාවකි.

මේකට පාදකවන කුඹුර එම ගැමියන් හැඳින්වූයේ "යාල මඩ" කියාය. එහි වූ විශාල ලියද්දක කොටසකට ගොවියන් බැසීමට භය වූයේ අතීතයේ සිට පැවැත එන මේ අත්භූත කථාවේ ප්‍රතිඵලයක් නිසාය.



මෙම වෙල්යායේ කිලෝ මීටරයකට පමණ පහලින් ගලාබස්නා මනහර ඔය මෙම කථාවට සම්බන්ධවෙයි. මෙම ඔය මහා බෑවුම් සහිත දෙපසකින් යුත්තවන අතර එහි මහා ගැඹුරු වූ වලකින් රත්රං ආඳෙකු මතුවනබව පැරන්නෝ කියති. මෙම ආඳා ඇල්ලීමට ගිය සියළු දෙනාම බිලිගත් බව ඇසූ කාගේත් භය දෙගුන තෙගුන කළේය. මේ නිසාම මෙම දිය වල ලඟින් යාම පවා බොහෝ දෙනෙක් ප්‍රතික්ෂේප කළේය. මේ වතුරවල ගැමියන් අතර ප්‍රසිද්ධ වූයේ "ආඳාවල" කියාය. ඊටත් වඩා බිහිසුණු දෙයනම් අර ඉහත විස්තරකරන ලද කුඹුරේ එරීගිය හරක්බානක් මෙම ආඳාවලින් මතුවූ බවට පැවති කථාවයි.


මෙම කථාවන් මෙසේ තිබියදී එක් මෝඩපහේ අයෙකු මෙම එරෙන කුඹුරට බැස්සේ කාටත් පෙනෙන සේ. මෙම කථාවට අභියෝග කරමිණි. එහෙත් ගතවූයේ සුළුමොහොතකි ඔහු

කරවටක් එරීමට පටන්ගත් අතර අවට සිටි ගොවින් සහභාගී වී ලණු දමා ඔහු බේරා නොගත්තානම් එදා හරක්බානට වූ දේ ඔහුට වියහැකිව තිබූ බව කාගේත් කථාබහට ලක්වූවේය.

## 6. බොරුවේ ප්‍රතිවිපාක

ඈත පිටිසර ගොවිගමක මිනිස්සු හතු හෙවත් බිම්මල් ආහාරයට ගැනිමට මහත් ප්‍රියතාවයක් දැක්වීය. සමහර කාලවලට මෙම ගමේ පිපෙන හතු වර්ග රාශියකි. ඒ අතර ලේන බිම්මල්, ඌරු බිම්මල්, වැලි බිම්මල්, හත් පොලයා බිම්මල්, ඉඳලොලු, යනාදිය ප්‍රධාන තැනැක් ගත්තේය. මින් ඉඳලොලු ඉතා රසවත් ව්‍යාංජනයක් වූ අතර එය පිපෙන්නේ කමත්වල ඇති දිරාගිය පිදුරු අතරය.

මෙම ගමේ ඉඳලොලු වැඩියෙන් පිපෙන ප්‍රසිද්ධ කමතක් වූ අතර එහි පිපෙන බිම්මල් කැඩීමට මහත් තරගයක් ද වූයේය. මේ නිසාම ගමේ ඇතැම් ගැහැණු බිම්මල් කැඩීමට යන්නේ ඉතා පාන්දරය. පසු වී යන අයට එකදු බිම්මලක් කඩාගැනීමට නොහැකි වූ නිසා ඔවුන් පසු වූයේ මහත් කනස්සල්ලෙනි. මේ අතරින් කිරිබණ්ඩා පසුවූයේ මහත් දුකකිණි. ඒ ඔහු බිම්මල් කෑමට මහත් ගිජුකමක් දැක්වූ නිසාය.



මේ ගමේ වැඩිහිටි අයෙකුගේ මරණය සිදුවීමත් ඔහුගේ මිණිය මෙම කමත අසල වැලලීමත් කිරිබණ්ඩාට සතුටට කරුණක් වූයේ ඒ නිසා හිමිදිරි පාන්දර බිම්මල් නෙළීමට ගැහැණුන් නොඑයි කියා සිතූනිසාය. සාමාන්‍යයෙන් මෙම ගමේ බොහෝ දෙනෙක් සොහොන් ලඟට නොගියේ හොල්මන් වලට භිය වූ නිසාවෙනි.

මෙයින්ද කිරිබණ්ඩාට හතු කෑමට නොලැබීම නිසා ඒ සඳහා හොඳ උපායක් කල්පනා කළේය.


"යන්න එපා, ඔය කමතේ තඩි නයෙක් ඉන්නවා, මම අද උදෙත් දැක්කා, ඌ ඔය කමතෙන් හෙල්ලෙන්නේ නැහැ මේ ඊයේ ඉදන් තමයි ඇවිල්ලා තියෙන්නේ."

මේ කථාව කියුවේ මේ ගමේ ඉන්න කථා පතුරන්නෙකුටයි. මේක ගමපුරාම පැතුරෙව්වා කොහොමහරි. මෙම විශ්වාස කළ කිසිවෙක් නැවැත මේ කමත පලාතේ ගියේ නැතිලු. කිරිබණ්ඩා දැන් තනියම හතු කඩනවාලු. එහෙත් මේ බොරුව වැඩිකල් ගෙනියන්න නොහැකි වු නිසා එය ගම්මු වටහා ගත්තට පස්සේ කිරිබණ්ඩා හොඳටෝම ගුටි කැවාලු.

## 7. තැඹිලි වල්ල බෑ හැටි

ඈත පිටිසර ගමක ගොවියන් විසින් පවත්වන ලද මහා ශ්‍රමදානයකි. විශේෂයෙන් ගමේ කුඹුරුවලට යන මාර්ග සකසා ගැනීමටත් එම ගම මැදින් වැටී ඇති ගම්සභා මාර්ගය ශුද්ධ

කරගැනිම අරමුණු කරගෙන මෙම ශ්‍රමදානය සංවිධානය කරන ලද්දේ කුඹුරුවැඩ පටන් ගැනිමට පෙරාතුවය.



ගොවි ගෙවිලියන් විශාල ප්‍රමානයක් මීට සහභාගී වූ අතර මේ සියළු දෙනාම දැඩි උනන්දුවකින් කටයුතු කිරීම මෙම මාර්ගය ප්‍රයෝජනයට ගන්නා අනිකුත් ගම්වල වැසියන්ගේ ප්‍රසාදයට ද හේතු විය. මෙම ශ්‍රමදානයේ දී මෙම මාර්ගය අසල වූ ගෙවල් වලින් ලද සංග්‍රහ ආදියෙන් අඩුවක්නම් නොවීය. මේ අතර වුයේ තැඹිලි ගස් කීපයක් තිබූ නිවසකි. මේ නිවැස් හිමියා ශ්‍රමදානයට සහභාගී වූවන්ට කියා සිටියේ ඇති තරම් තැඹිලි කඩා ගෙන පිපාසය සංසිඳුවා ගන්නා ලෙසයි. තැඹිලි වලු කපා බා දීමට ඉදිරිපත් වූයේ තරුණයෙකි. තැඹිලිවලු බිමට බෑමට අවශ්‍ය කඹයක් ද රැගෙන ගසට නැගගත් මේ තරුණයා කකුලට දා ගෙන ගිය වලල්ල පොල්පිති දෙකක් අතරේ රඳවා ගසට රැගෙන ගිය කඹය තවත් පොල් අත්තක පටලා එයි කොණ තැඹිලි වල්ලේ බැන්දේ ඉතා ජයග්‍රහී ලෙසින්ය.

කඹය තදින් අල්ලාගත් ඔහු "හරි ඔන්න කපනවා" කියානවාත් සමගම තැඹිලි වල්ල බිමට වැටී සියළුම ගෙඩි බිදි ගියේය. මොහු කර ඇත්තේ තැඹිලි වල්ල මුලින් බැඳ ඊට පහලින් කැපීමය. මෙහිදී වැරද්ද පෙන්වා දී ඊලඟ තැඹිලි වල්ලබෑමට ඔහුට උපදෙස් දුන්නත් නැවැතද කර තිබුනේ පෙර පරිදි මෝඩ වැඩේය.

තැඹිලි කැපුම්කරුගේ මෝඩ වැඩ හදුනාගත් ගොවියෝ ඔහුට නැවැත කවමදාවත්ම මැවැනි වැඩක් භාර දී නැතිලු.